# ජනවාර්ගික සුසංවාදය හා ප්‍රතිසන්ධානය අනතුරේ හෙළන මෑත කාලීන සිදුවීම් පිළිබඳ CPA ප්‍රකාශය

***2016 නොවැම්බර් 15, කොළඹ, ශ්‍රී ලංකාව:*** විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය (CPA) ශ්‍රී ලංකාව තුළ ජනවාර්ගික හා ආගමික සුසංවාදය හා ප්‍රතිසන්ධානය පිළිබඳ අශුභදායක පෙරනිමිති පහළ කරන මෑත කාලීන සිදුවීම් මාලාව ගැන බරපතළ ලෙස සැලකිලිමත්ව සිටී. යාපනයේ දී විශ්වවිද්‍යාල සිසුන් දෙදෙනෙකු මරා දැමීම, ජනාධිපති ලේකම් කාර්යාලය අබියස ආබාධිත සොල්දාදුවන් පැවැත්වූ විරෝධතාව අනෙකුන් විසින් ගසා කන ලද බව පෙනී යාම, බෞද්ධ පූජ්‍ය පක්ෂයේ සමහර සාමාජිකයන් හා වෙනත් විරෝධතා කණ්ඩායම් සුළුතරයන්ට එරෙහි වෛරී කථනය වැඩි වැඩියෙන් යොදා ගැනීම සහ සමාජ මාධ්‍යය තුළ සුළුතරයන්ට විරුද්ධ වෛරී කථනය පුළුල්ව පැතිර යාම මීට ඇතුළත් වේ. අපගේ ප්‍රජාතන්ත්‍රවාදය හා පාලනය වැඩි දියුණු කිරීම අභිමතාර්ථය කර ගත් නීති ප්‍රතිසංස්කරණවලට ජාත්‍යෝත්තමවාදී හා ඉවසා නොදරන බලවේග වළ කපමින් සිටීමේ සලකුණු නැවත වතාවක් දකින්නට තිබීම නිසා අපි අතිශයින් ම කනස්සල්ලට පත්ව සිටිමු.

නිසැකයෙන් ම ප්‍රචණ්ඩ හා බෞද්ධ නොවන අදහස්වලින් රැකුල් ලැබ විශේෂයෙන් ම සමහර බෞද්ධ භික්ෂූන් විසින් යොදා ගැනෙන නින්දිත භාෂාව සමාජ මාධ්‍යය තුළ පුළුල්ව සංසරණය වෙමින් පැවතීම විශේෂයෙන් ම කනස්සල්ල හා කම්පනය ඇති කරන බව අපට දැනේ. ප්‍රචණ්ඩත්වයට නැඹුරු වූ හා අශ්ලීල වචන භාවිත කරන මෙම ඉතා ම සුළුතර භික්ෂු පිරිස සාමය පෙරදැරි කර ගත් ආගමක් කෙලෙසනවා පමණක් නො ව දැන් සිදු වෙමින් පවත්නා ප්‍රතිසංස්කරණ සැලසුම් කළ හා ඊට අනුප්‍රාණය දුන් අපවත් වී වදාළ මාදුළුවාවේ සෝභිත හිමියන් වැනි සභ්‍යත්වයේ හා ප්‍රතිසන්ධානයේ නායකයන් පිළිබඳ මතකයට පරිභව ද කරති. එපමණක් නො ව, ප්‍රජා මට්ටමේ දී බොහෝ භික්ෂූන් සාමය හා ප්‍රතිසන්ධානය පිළිබඳ පරිශ්‍රමයන්හි ක්‍රියාකාරීව නිරතව සිටින නමුත් ඔවුන් කරන වැඩ කටයුතුවල උද්වේගකර නොවන ස්වභාවය නිසා ඔවුහු ප්‍රධාන ප්‍රවාහයේ හෝ සමාජ මාධ්‍යයේ අවධානයට ලක් නො වෙති.

මෙම සියලු සිදුවීම්වල දී නො වේ නම් ඉන් බොහොමයක දී හිතාමතා සංවිධානය කිරීමක් ද දේශපාලන න්‍යාය පත්‍ර රට වර්තමානයේ දී සාමය, ප්‍රතිසන්ධානය හා ප්‍රතිසංස්කරණය කරා යන ගමන ආපසු හැරවීමට බරපතළ ලෙස අධිෂ්ඨාන කර ගැනීමක් ද විශේෂයෙන් ම පූජ්‍ය පක්ෂයේ සාමාජිකයන් සම්බන්ධ වී සිටින තැන්වල දී පොලීසිය හා සිවිල් සේවකයන් පටිපාටිය නැවත ස්ථාපනය කිරීමට නො ව ගරු කිරීමේ සංස්කෘතියකට යටත් වීමක් ද පවතින බව පෙනී යයි. ජනවාර්ගික හා ආගමික වෛරයේ විෂ පිරි මෙම වාතාවරණය දුස්සන්ධානයන් හා දේශපාලන කූටෝපායන් පිළිබඳ සැකය හා කටකතා නිසා සංකීර්ණ වේ. වඩාත් කනගාටුදායක කරුණ වන්නේ බියෙන් හෝ අනුග්‍රහ දැක්වීමකින් තොරව නීතියේ පාලනය බලාත්මක කිරීමේ දී රාජ්‍ය ආයතනවල පැත්තෙන් උදාසීනත්වයක් හෝ අසමත් වීමක් පවතින බව පෙනී යාම යි.

එවැනි කටකතාවලට පදනමක් නැති නමුත් රජයේ බෙලහීනකම, උදාසීනත්වය හෝ දුර්වලකම පිළිබඳ හැඟීමක් මුල් බැස ගැනීමට සුළු හෝ ඉඩක් දීමෙන් සිදු වනු ඇත්තේ වෛරය හා බෙදීම උසි ගැන්වීමට අපේක්ෂා කරන අයට ධෛර්යයක් දීම පමණකි. බලතල හා ආයතනික ස්වාධීනත්වය ශක්තිමත් කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන අධිෂ්ඨානය හෝ ධාරිතාව නොමැති නම් යන්තම් මේ පසු ගිය වසරේ දී දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හඳුන්වා දෙන ලද නීතිය බලාත්මක කිරීම සම්බන්ධ ප්‍රතිසංස්කරණවලින් කිසි පලක් නොවනු ඇත.

සමාජ මාධ්‍යයේ යුගය වන වත්මන් යුගයේ දී සුළු පරිමාණ කඩා කප්පල් කිරීම් හා අසමගිකම් ප්‍රමාණවත් අවධානයක් දිනා ගැනීමට සමත් නොවන බව සැබෑ නමුත් මෙය වනාහි ආණ්ඩුවේ වෙනසක් ඇති කිරීම සඳහාත් පශ්චාත් යුද ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියකට මුල පිරීම සඳහාත් වරම් ලබා දීමට පසු ගිය වසරේ දී එකට එක් වූ සියලු ප්‍රජාවන්ට අයත් ශ්‍රී ලාංකිකයන්ගේ මනස් තුළ හොඳ හිත හා සහයෝගිතාව සම්බන්ධයෙන් ජනිත ජාතික මනෝගතිය බරපතළ ලෙස ආපසු හැරවීමකි. කනස්සල්ල දනවන පෙර කී සිදුවීම් සිදු වන්නේ අප තව මත් ජනතාව වරම් ලබා දුන් දේශපාලනික හා ආණ්ඩුක්‍රමික ප්‍රතිසංස්කරණ මාවතෙහි අඩකටත් අඩු දුරක් පමණක් ගමන් කොට තිබිය දී ය. අපගේ අනාගත සාමයේ, සමෘද්ධියේ හා සන්තුෂ්ටියේ මූලික පදනම වන ප්‍රතිසන්ධානය, යුක්තිය හා යහපාලනය සම්බන්ධ අත්‍යවශ්‍ය පදනම් තහවුරු කිරීමේ ක්‍රියාවලිය අවදානමට ලක් කරන ඔවුහු අප විසින් අන්තිමේ දී අත් හැර දමන ලද අඳුරු වූත් ද්වේෂ සහගත වූත් යුගය කරා අප ආපසු රැගෙන යාමට තර්ජනය කරමින් සිටිති.

තමන් තෝරා පත් කෙරුණු පදනම වන බහුත්වවාදය හා ඉවසා දැරීම පිළිබඳ ප්‍රජාතාන්ත්‍රික සාරධර්ම කෙරෙහි තමන්ගේ කැප වීම නැවත ප්‍රකාශයට පත් කිරීම සඳහා සහ බිය ගැන්වීම හා ප්‍රචණ්ඩත්වය පිළිබඳ

තර්ජන නො තකා නීතිය බලාත්මක කිරීමට පොලීසියට හා සිවිල් සේවකයන්ට ආත්ම විශ්වාසය ලබා දෙන බව සහතික කිරීම සඳහා මෙම ඊර්ෂ්‍යා පරවශ බලවේගවලට එරෙහිව බලගතු වූත් මූලධර්මාත්මක වූත් නායකත්වයක් සම්පාදනය කිරීමේ වගකීම ජනාධිපතිවරයා හා අග්‍රාමාත්‍යවරයා යන දෙදෙනාට ම ඇත. දේශපාලන සංස්කෘතිය හා පරිචයන් ප්‍රතිසංස්කරණය නොකෙරෙන්නේ නම් නීතිමය හා ආයතනික ප්‍රතිසංස්කරණවල අර්ථයක් නැති යන කරුණත් එහි ලා දේශපාලන නායකයන් විසින් සැපයෙන නායකත්වය අත්‍යවශ්‍ය ය යන කරුණත් අපට යළි සිහිපත් වේ. ආගමික හා සමාජ නායකයන් මෙන් ම පුරවැසියන් ද මෙම කඩා කප්පල්කාරී පුද්ගලයන්ගේ හා කණ්ඩායම්වල අනභිමත හැසිරීම පිළිබඳ තම බලගතු නොසතුට ප්‍රසිද්ධියේ පළ කරනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

මෙම සිදුවීම් සම්බන්ධයෙන් ද ඒවා සිදු කළවුන් සම්බන්ධයෙන් ඔවුන්ගේ තරාතිරම නො තකා ද දැඩි ලෙස හා සාධාරණ ලෙසත් ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයට එම සිදුවීම්වලින් එල්ල වන සැබෑ තර්ජනයේ බරපතළකම නිසි පරිදි සැලකිල්ලට ගනිමිනුත් කටයුතු නොකෙරෙන්නේ නම් එවැනි සිදුවීම් පාලනයෙන් බැහැර වී තව තවත් වර්ධනය විය හැකි ය. කිසි ම සංවේදී ශ්‍රී ලාංකිකයෙක් - ඔවුන්ගෙන් තීරණාත්මක බහුතරයක් ප්‍රතිසංස්කරණය හා ප්‍රතිසන්ධානය උදෙසා වරක් නොව දෙවරක් ම ඡන්දය දී ගත වී ඇත්තේ එක් වසරක් පමණකි - අප රට අතීත ගැටුම හා එදිරිවාදීකම කරා ආපසු යා යුතු යැයි ප්‍රාර්ථනා නො කරති. වඩාත් ගුණාත්මක ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් උදෙසා අපගේ සියලු ජනතාවන් තුළ පවත්නා පැහැදිලි අභිලාෂය සහ එය තිරසර කිරීම සඳහා දැන් සිදු වෙමින් පවත්නා ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය වෛරය හා අනර්ථය සම්පාදනය කරන්නන් විසින් කෙරෙන බිය ගැන්වීම් හමුවේ ඇති විය හැකි සෑහීමට පත් වීම හා දුර්වලකම කරණ කොට ගෙන කිසි සේත් අපතේ යාමට ඉඩ දිය නොහැකි ය, අපතේ යාමට ඉඩ නො දිය යුතු ය.